# රෝහණ දේශයේ පබ්බතාරාම වාස්තුවිද්‍යාව පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

( මදුනාගල පරිශ්‍රය ඇසුරින් සිදු කෙරෙන විමර්ශනයක්)

ඩබ්.එම් චතුරි පූර්ණිමා[1], කේ.එච්.එම් රසිකා දර්ශනි මල්කාන්ති[2]

ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය
[1]cathu933@gmail.com, [2]rasikamalkanthi1122@gmail.com

ප්‍රමුඛ පදඃ වාස්තුවිද්‍යාව, ගල්ලෙන්, පොකුණු, සංඝාවාස, පියගැටපෙළ

## හැඳින්වීම

ශ්‍රී ලාංකීය ඉතිහාසයේ රෝහණ රාජ්‍යයේ ඉපැරණි ඓතිහාසික සිද්ධස්ථානයක් වශයෙන් මදුනාගල විහාරස්ථානය වැදගත් වේ. දකුණු පළාතේ සූරියවැව ග්‍රාමයට නුදුරුව මෙම විහාරස්ථානය පිහිටා ඇති අතර මදුනාගල විහාරස්ථානයේ වාස්තුවිද්‍යාත්මක අංග ආගමික කටයුතු සදහා ඉදි කළ ඉදි කිරිම් හා භික්ෂු නේවාසික කටයුතු සඳහා ඉදි කළ ඉදි කිරීම් ලෙස පෙන්වාදිය. හැකි ය. පුරාණ මදුනාගල විහාරස්ථානයේ භික්ෂු පරිහරණය සදහා ඉදි කළ වාස්තුවිද්‍යාත්මක ඉදිකිරිම් පිළිබඳ අධ්‍යයනය මෙම පර්යේෂණයේ ප්‍රමුඛ අරමුණයි. මෙම විහාරස්ථානයේ භික්ෂු පරිහරණය සදහා ඉදි කළ වාස්තුවිද්‍යාත්මක ඉදිකිරිම් මොනවාද? යන්න ගැටළුව මූලික කොට මෙම පර්යේෂණය සිදු වේ.ආරම්භක යුගයේ දී ගල්ලෙන් සංකිර්ණයන් ව තිබී භික්ෂු ආවාසයක් වශයෙන් වර්ධනය වී පසු සමයක ලෙන් විහාරස්ථානයන් බවට පරිවර්තනය විම සමඟ වර්ධනය වන වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම් බොහෝමයක් විහාරස්ථවාසී භික්ෂූන් වහන්සේලාගේ පරිහරණය සඳහා වෙන් වි ඇත. එසේ භික්ෂූන් වහන්සේලාගේ පරිහරණය උදෙසා නිර්මාණය වන වාස්තුවිද්‍යා ඉදිකිරීම් පරිසරයේ ස්භාවික පිහිටීම අනුව නිර්මාණය වූ අතර ග්‍රැනයිට් පාෂාණවලින් ගහණ පරිසර පද්ධතිය තුළ පැවති ගල්ලෙන්, පර්වත මුලින් සඳහන් කළ ආගමික ඉදිකිරීම්වලට මෙන්ම භික්ෂු පරිහරණය උදෙසා වූ වාස්තුවිද්‍යා නිර්මිතයන්වලට යොදා ගන්නා ලදි.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණය සදහා ක්ෂේත්‍ර පර්යේෂණවලින් සොයාගත් භික්ෂු පරිහරණය සඳහා ඉදි වූ වාස්තුවිද්‍යාත්මක ඉදි කිරිම් අධ්‍යයනය කිරිම මූලිකව ම සිදු කෙරේ. එහි දී මදුනාගල විහාරස්ථනෙයේ භික්ෂු පරිහරණය සදහා ඉදි වූ අතිත හා වර්තමාන වාස්තුවිද්‍යාත්මක අංග අධ්‍යයනයට ලක් කෙරේ. ක්ෂේත්‍ර අධ්‍යයනය හා ක්ෂේත්‍ර නොවන අධ්‍යයනය යන ක්‍රමවේදයන් ද්විත්වය භාවිතයෙන් දත්ත ගොනු කරන ලදි. ක්ෂේත්‍ර අධ්‍යයනය යටතේ අධ්‍යයන ගැටළුවට අදාළව මෙම විහාරස්ථානයෙ හි වාස්තුවිද්‍යාත්මක අංග නිරික්ෂණය, ඡායාරූපකරණය සිදු විය. ක්ෂේත්‍ර පර්යේෂණයේ දි විහාරාධිපති ස්වාමින් වහන්සේ හා මහජනයාසමඟ සම්මුඛ සාකච්ඡා පවත්වන ලදි.මූලාශ්‍ර පරිශීලනය යටතේ ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍ර භාවිත කරනු ලැබේ.

මෙම අධ්‍යයනයේ පර්යේෂණ ක්ෂේත්‍රය මදුනාගල විහාරස්ථානයේ භික්ෂු පරිහරණය සඳහා නිම වූ වාස්තු විද්‍යාත්මක ඉදි කිරීම්වලට සීමා කරනු ලැබේ. මෙහි දී ගල්ලෙන්, සංඝාවාස, පියගැටපෙළ, සක්මන්මළුව, පොකුණු යන භික්ෂු පරිහරණ ඉදි කිරීම්වලට පර්යේෂණ ක්ෂේත්‍රය සීමා කෙරේ.

## ප්‍රතිඵල හා සාකච්ඡා

මෙම පර්යේෂණය තුළින් පුරාණ මදුනාගල විහාරස්ථානයේ භික්ෂු පරිහරණය සඳහා ඉදි කළ වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම් පිළිබඳ පර්යේෂණයට ලක් කෙරේ.විහාරස්ථානයේ දක්නට ලැබෙන වාස්තුවිද්‍යා ඉදිකිරීම් ප්‍රමාණයක් භික්ෂූන් වහන්සේලාගේ පරිහරණය උදෙසා නිර්මාණය වී ඇති අතර බොහෝමයක් නූතන වාස්තුවිද්‍යා නිර්මිතයන් වන අතර ඒවා ගල්ලෙන්, සංඝාවාස, පොකුණු, පියගැටපෙළ, සක්මන් මළු ආදී අංගවලින් යුක්ත වේ. විහාරස්ථානයේ භික්ෂූන් වහන්සේලාගේ පරිහරණය උදෙසා නිර්මාණය වී ඇති වාස්තුවිද්‍යා අංග අතරින් ගල්ලෙන් වැදගත් වන අතර අතීත වාස්තුවිද්‍යා නිර්මිතයන් හී ලක්ෂණ වන කටාර සාධක, බිත්ති නිර්මාණය කළ බවට ඇති සාධක තුළින් ඒවා භාවිත තත්වයේ පැවති වැදගත් වාස්තුවිද්‍යා නිර්මිත ලෙස පෙන්වා දිය හැකිය. මෙහි දක්නට ලැබෙන ගල්ලෙන් ප්‍රමාණය 8 කි. ඒවා අතරින් බොහෝමයක් වර්තමානය වන විටත් භික්ෂූන් වහන්සේලාගේ පරිහරණය සඳහා භාවිත වූ බවතහවුරු වේ.

දාන ශාලා භික්ෂු පරිහරණය උදෙසා නිර්මිත වාස්තුවිද්‍යාත්මක අංගයක් වූ අතර භික්ෂූන් වහන්සේලාගේ දානමය කටයුතු සඳහා වෙන්වී ඇති එම ලෙන විහාරස්ථානයට ප්‍රවිෂ්ට වන ප්‍රධාන මාර්ගයේ මඳ දුරක් ඉහළට ගමන් කරන විට පර්වත තලාව ආශ්‍රය කරගනිමින් නිර්මාණය වී තිබේ. ගල්ලෙන් තුනකින් සමන්විත එම පර්වත කොටසේ මැද පිහිටි ගල්ලෙනක් මේ සඳහා යොදා ගෙන ඇති අතර එහි ප්‍රමාණය දළ වශයෙන් අඩි 20 ක් පමණ දිගකින් හා අඩි 23X ක් පළලින් ද ඇතැම් තැනක අඩි 12 ක් තරම් උසකින් හා ඇතැම් තැනක අඩි 6 ක් තරම් උසකින් ද නිර්මාණය වී තිබේ. පැරණි වාස්තුවිද්‍යා නිර්මිත ලක්ෂණ අතර කටාර සාධක මැනවින් එහි දැක ගැනීමට හැකිවේ. එය අභ්‍යන්තරයේ හුණු පිරියම් කරමින් භාවිත තත්ත්වයට ගෙන තිබේ. ගල්ලෙන්වලින් ලැබෙන ප්‍රයෝජන භික්ෂූන් වහන්සේලා උදෙසා වෙන්ව පැවති බව සඳහන් කළ හැකි අතර ඒවා නිර්මාණය වූ කාලවකවානුව කටාර නිර්මාණය කළ අනුරාධපුර මුල් සමයට අයත් වේ.

වර්තමානයේ මෙම විහාරස්ථානයේ සංඝාවාසවල දක්නට ලැබෙන ප්‍රධාන සංඝාවාස වර්තමානයේ දී ගඩොල්, සිමෙන්ති ආදී ද්‍රව්‍ය භාවිතයෙන් නිර්මාණය කර ඇත. භික්ෂූන් වහන්සේලා කිහිප නමකගේ ආවාස බවට ඒවා පත් වී ඇත. භූමියේ වන ස්වභාවික ග්‍රැනයිට් පාෂාණය උපයෝගී කර ගනිමින් ඉහළ මාලය වෙත ගමන් කිරීම උදෙසා පඩි පෙල් නිර්මාණය කර තිබේ. සංඝාවාස අංක 03 ඉහළ බෝධිය අසල දක්නට ලැබෙන සංඝාවාසය භික්ෂූන් වහන්සේලාගේ ප්‍රයෝජන උදෙසා නිර්මාණය වූ නූතන වාස්තුවිද්‍යා අංගයක් වේ. පර්වතයඋපයෝගී කරගනිමින් ජල අවශ්‍යතා සපුරා ගැනීම උදෙසා අතීතයේ පොකුණු නිර්මාණය වූ අතර ප්‍රධාන පොකුණු අටක් මෙහි ජල අවශ්‍යතාවයන් උදෙසා නිර්මාණය වී ඇත. අංක 01 දරණ පොකුණ මදුනාගල විහාරස්ථානයේ දක්නට ලැබෙන විශාලතම පොකුණ වශයෙන් මෙය හඳුන්වාදිය හැකිය. වට අඩි 73 ක් පමණ වන එහි ගැඹුර අඩි 3X ක් පමණ වේ. විශාල පර්වත තලාවක

පිහිටි වැඩි ජල ධාරිතවක් රැස්කර තැබිය හැකි මෙය අතීතයේ භික්ෂූන්ගේ ජල අවශ්‍යතා සපුරාලීම උදෙසා ඉමහත් ප්‍රයෝජන ගෙනදෙන්නක් විය. අංක 02 දරණ පොකුණු සංකීර්ණය මෙම විහාරස්ථානයේ දක්නට ලැබෙන ප්‍රධානතම පොකුණු සංකීර්ණයක් වන මෙහි පොකුණු 5 ක් දක්නට ලැබේ. එහි පොකුණු වට අඩි 101 ක් හා වට අඩි 72 ක් තරම් විවිධ ප්‍රමාණවලින් යුක්ත වීමෙන් විශාල ජල ධාරිතාවක් ඒ තුළ රැස්කර භික්ෂූන් වහන්සේලාගේ අවශ්‍යතා උදෙසා ඒවා පරිහරණය කරන්නට ඇත. මදුනාගල විහාරයට පිවිසීම සඳහා වාස්තුවිද්‍යා නිර්මිතයන් යටතේ අතීතයේ ඉදිවී පැවති පියගැටපෙළක් හමුවී ඇත. ග්‍රැනයිට් පාෂාණ පදනම් කර නිර්මාණය වී ඇති මෙම පියගැටපෙළ අංක 02 දරණ ලෙන් විහාරයට දකුණු පස ඇති කඳු බෑවුමේ පිහිටා තිබේ. දිග අඩි 2 අගල් 9 1/2 ක් හා පළල අඩි 2 ක පමණ කොටසක් වේ. වර්තමාන නිර්මාණයක් යැයි අනුමාන කරන මෙම සක්මන් මළුව භික්ෂූන් වහන්සේලාගේ පරිහරණය උදෙසා නිර්මාණය වූවකි. දැනට එය භාවිතයෙන් ඈත්ව පැවතිය ද මළුව වැලි යොදා සකස්කර ග්‍රැනයිට් පාෂාණ කොටස්වලින් සෘජුකෝණාස්‍රාකාරවසිටිනසේ සකස් කර තිබේ. එය කුමන කාලවකවානුවක භාවිත වූවක් ද යන්න පිළිබඳ තොරතුරු හමු නොවේ. වයඹ, ගිණිකොන දිශානුගතව මෙම සක්මන් මළුව ඉදිකර ඇති අතර දිග අඩි 31 අඟල් 6 කින් හා පළල අඩි 3 කින් යුක්ත වේ. මෙලෙස වාස්තුවිද්‍යාත්මක අංග රාශියකින් නිර්මිත මදුනාගල විහාර පරිශ්‍රය පිළිබඳ විද්වතුන්ගේ අඩු අවධානයකට ලක් වූ අතර ශ්‍රී ලංකා ඉතිහාසයේ ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් වාස්තුවිද්‍යාත්මක අංගයන්ගෙන් පරිපූර්ණ පුරාවිද්‍යාත්මක ස්ථානයක් ලෙසට පෙන්වා දිය හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ


සුමංගල, හික්කඩුවේ ශ්‍රී. සහදේවරක්ඛිත, බටුවන්තුඩාවේ. (2003)*මහාවංසය.* බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

සිල්වා, නිමල්. (2005)*හම්බන්තොට දිස්ත්‍රික්කයේ සමාජ සංස්කෘතික උරුමය.* පන්නිපිටියඃ මොරවක මුද්‍රණාලය.

සෝරත හිමි. (2002)*බෞද්ධ රෝහණය.*නුගේගොඩඃ සරසවි ප්‍රකාශකයෝ.